# ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම පිළිබඳ අධ්‍යයනයක්

## A Study on Sexuality and Gender Discrimination

ගොමිල ගුණාලංකාර හිමි

**Abstract**

Discrimination based on the sexuality is a commonly seen situation in the society. Plenty of dogmatic ideas and myths, such as women are weaker and inferior whereas men are stronger and superior, are there in Sri Lanka as well as in many other socio-cultural contexts. The object of this study is to investigate that in what range the men and women are similar and/or different and whether there is any significant psychological fact to prove the pertinence of gender discrimination. For this purpose, Fundamental concepts and theories of Bio-psychology, Social psychology and General psychology were examined in this study. This study was an archival research under qualitative research methods. Data was collected using library and web resources and data was analyzed using content and thematic analysis methods. According to the findings, males and females show certain biological differences in accordance with the chromosome variation of sexes which are evolutionary important and significant in the survival of human kind. However, no significant differences in the function of neural activities and hormone system are found to prove suitability of the gender discrimination. Even though the males and females show minor differences of their psychological functions such as thinking, information processing, problem solving and memory, they are not signifying the inferiority or superiority of cognition in women or men. Such variations of psychological factors

are seen even in sexually similar groups. Out of numerous personality traits, extraversion, anxiousness, trustworthiness and tender-mindedness are higher in women than men whereas men show having higher self-esteem and to be more assertive than women. But, no sex difference can be seen in personality traits such as social anxiety, impulsiveness and expressing ideas etc. According to social psychologists, gender discrimination is a social construct. Newborns are subjected to that discrimination based on sex difference from their birth, and they are then trained to continue it further. In conclusion, no significant psychological reason can be found to prove the pertinence of gender discrimination and, each and every individual has the right to have equal opportunities with no discrimination based on sex difference.

**Key Words:** Gender, Sexuality, Discrimination, Psychological Factors

**සාරසංක්ෂේපය**

ලිංගික අනන්‍යතාව මත පදනම්ව පුද්ගලයන් වෙනස් කොට සැලකීම සමාජය තුළ බහුලව දැකිය හැකි තත්වයකි. ශ්‍රී ලංකාව තුළ මෙන්ම වෙනත් බොහෝ සමාජ සංස්කෘතික සන්දර්භයන්හිද ස්ත්‍රිය දුර්වල හා පහත් ය, පුරුෂයා උසස් හා ශක්තිවන්තයා වේ යනාදි මිත්‍යා ආකල්ප බහුල වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මනෝවිද්‍යාත්මක න්‍යාය සංකල්ප අනුව ස්ත්‍රී පුරුෂයන් වෙනස් හා සමාන වන්නේ කුමන පරාසයක් තුළ ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස් කොට සැලකීමේ යෝග්‍ය බව තහවුරු කිරීම සඳහා එම මනෝවිද්‍යාත්මක න්‍යායන් ප්‍රමාණවත් සාදක සපයන්නේද යන්න විමර්ශනය කිරීම වේ. ඒ සඳහා මෙහිදී ජීව මනෝවිද්‍යාත්මක, සමාජ මනෝවිද්‍යාත්මක හා සාමාන්‍ය මනෝවිද්‍යාත්මක වශයෙන් මූලික න්‍යාය සංකල්ප අධ්‍යයනය කරන ලදී. ග්‍රන්ථ සන්ධාර අධ්‍යයන ක්‍රම අනුව සන්ධාර හා තේමා විශ්ලේෂණ ක්‍රම භාවිත කරමින් සිදු කරන ලද මෙම ගුණාත්මක පර්යේෂණයේ දත්ත රැස් කිරීමේ ක්‍රමය

ලෙස පුස්තකාල හා අන්තර්ජාල මූලාශ්‍රය පරිශීලනය කරන ලදී. විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව පුද්ගල ශරීරයක වර්ණදේහයන් බෙදී යාම මත පදනම්ව ඇති වන බොහෝ දේහවිද්‍යාත්මක සම විෂමතාවන් පරිණාමීය වශයෙන් වැදගත් වන හා වර්ගයාගේ පැවැත්ම සඳහා අතිශයින් ඉවහල් වන සාධකයන් ය. ඒ හැර මොළයේ හා අන්තරාසර්ග පද්ධතියේ ක්‍රියාකාරිත්වය තුළ ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම සාධාරණීකරණය කිරීමට තරම් සුවිශේෂ සාධකයන් නොමැති බව විද්‍යාත්මක සොයා ගැනීම් පෙන්වා දේ. එසේම චින්තනය, තොරතුරු සකස් කිරීම, ගැටලු විසඳීම, මතකය යන මනෝවිද්‍යාත්මක ලක්ෂණයන්හිදී ස්ත්‍රී පුරුෂයන් යම් යම් විෂමතාවන් ප්‍රකට කළද ඒ මත පදනම්ව ස්ත්‍රිය හෝ පුරුෂයා ප්‍රජානනිකව වඩාත් උසස් ලෙස හුවා දැක්වීමට තරම් සාධක නොවේ. එම මනෝවිද්‍යාත්මක ලක්ෂණයන්හි විවිධත්වය සමාන ලිංගිකයන් අතර පවා දැකිය හැකි ය. පුද්ගල පෞරුෂ ලක්ෂණ අතුරින් බහිර්වර්තී පෞරුෂ ලක්ෂණ, කාංසාව, විශ්වාස කිරීම සහ මෘදුබව යන ලක්ෂණවලින් පුරුෂයන්ට වඩා ස්ත්‍රීන් වැඩි වන අතර ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයා වඩා ගර්විත හා වැඩි ආත්ම සම්මානනයකින් යුක්ත වේ. නමුත් සමාජ කාංසාව, ආවේගශීලීබව හා අදහස් ප්‍රකාශ කිරීම ආදී පෞරුෂ ලක්ෂණවල ස්ත්‍රී පුරුෂ භාවයෙහි වෙනසක් නොවේ. සමාජ මනෝවිද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව පෙන්වා දෙන්නේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සමාජ නිර්මාණයක් වන බවයි. සමාජ සංස්කෘතික බලපෑම හේතුවෙන් ලිංගික අනන්‍යතාව මත එසේ වෙනස් කොට සැලකීමේ නැඹුරුවට නොදැනුවත්වම හා නිරායාසයෙන්ම නවජ දරුවා පාත්‍ර වන අතර එය පවත්වාගෙන යාමට ද ඔහු/ඇය කටයුතු කරයි. ඒ අනුව ස්ත්‍රී භාවය හෝ පුරුෂ භාවය මත පදනම්ව වෙනස් කොට සැලකීම යෝග්‍ය බව තහවුරු කිරීමට තරම් සුවිශේෂී මනෝවිද්‍යාත්මක සාදක පෙන්වා දිය නොහැකි හෙයින් සියලු දෙනා හට සමාන අවස්ථා හිමිවිය යුතු බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද** : ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, ලිංගිකත්වය, වෙනස් කොට සැලකීම, මනෝවිද්‍යාත්මක සාධක

**හැඳින්වීම**

ලිංගිකත්වය (Sexuality) හා ස්ත්‍රී පුරුෂ භාවය (Gender) යනු දෙඅංශයකි. ලිංගිකත්වය ජීවවිද්‍යාත්මක ප්‍රපංචයක් වන නමුත් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සමාජ-මනෝවිද්‍යාත්මක කරුණකි. එකී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස් කොට සැලකීම, ස්ත්‍රියට පුරුෂයා හා සමාන අයිතීන් අහිමි කිරීම දුරාතීතයේ පටන් පවතින සමාජ තත්වයකි. එය වර්තමාන සමාජයේද නිරන්තරයෙන් දක්නට ලැබෙන හා සාකච්ඡාවට භාජනය වන කරුණකි. ජීවවිද්‍යාත්මකව ලිංගික ඉන්ද්‍රියයන්ගේ ලක්ෂණ අසමාන නමුත් ඒ මත පදනම්ව ස්ත්‍රියට හෝ පුරුෂයාට වෙනස් කොට සැලකීම යෝග්‍ය නොවන බව මනෝවිද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන් හා වෙනත් මානව විද්‍යාඥයන් පොදුවේ පිළිගන්නා මතයකි.

මනෝවිද්‍යාත්මක පර්යේෂණවලින් පෙන්වා දෙන පරිදි ස්ත්‍රියගේ හා පුරුෂයාගේ මනෝවිද්‍යාත්මක අංශයන්හි යම් යම් වෙනස්කම් පැවතුනද ඒවා සැලකිය යුතු තරම් නොවේ. වර්තමාන ලෝකයේ සමාජ සංස්කෘතික විපර්යාසයන්ට අනුව ස්ත්‍රී පුරුෂ භූමිකා වෙනස් වෙමින් පවතින බව ද අධ්‍යාපනය, රැකියාව, දේශපාලනය ආදි සමාජ ආර්ථික ක්ෂේත්‍රයන්හි ස්ත්‍රිය සඳහා සමාන අවස්ථාවන් හිමි වන බව ද නිරීක්ෂණය කළ හැකිය. නමුත් ඇතැම් සංස්කෘතීන්හි, සමාජ තලයන්හි හා ඇතැම් සමාජ අවස්ථාවලදී ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත වෙනස් කොට සැලකීම ද සුලභව දැකිය හැකි වේ.

ගෝලීය වශයෙන් මෙන්ම ශ්‍රී ලාංකේය සමාජය තුළ ද කාන්තාවන්ට පුරුෂයා හා සම අයිතීන් හිමිවිය යුතු බව සාකච්ඡාවට බඳුන් වන නමුත් සමාජ ආර්ථික දේශපාලන ආදී ක්ෂේත්‍රයන්හි ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත වෙනස් කොට සැලකීම බහුලව දැකිය හැකි තත්වයකි. බොහෝ විට කාන්තාවක් කිසියම් හෝ ජීවන වෘත්තියක් තෝරා ගැනීමේදී ද ස්ත්‍රීත්වය ගැටලුවක් වන අවස්ථා බහුල ය. ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත වෙනස් කොට සැලකීම යුක්ති සහගත ද, එම වෙනස් කොට සැලකීම මනෝවිද්‍යාත්මක න්‍යායන් හා මගින් තහවුරු හෝ නිශේධනය වන්නේ ද යන්න විමර්ශනයට ලක් කළ යුතු වේ.

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සමාජය තුළ මුල් බැසගෙන පවතින ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් වෙනස් කොට සැලකීම පිළිබඳ ජීව මනෝවිද්‍යාත්මක, සමාජ මනෝවිද්‍යාත්මක හා සාමාන්‍ය මනෝවිද්‍යාත්මක කරුණු අධ්‍යයනය කිරීමයි. ඒ අනුව එම මනෝවිද්‍යා න්‍යාය සංකල්ප හා නූතන සමාජ සංස්කෘතික ප්‍රවණතා විශ්ලේෂණය කරමින් ලිංගික අනන්‍යතාව මත ස්ත්‍රී පුරුෂයන් සමාන හෝ වෙනස් වන්නේ ද යන්න අධ්‍යයනය කිරීමත්, සමාජය තුළ දැකිය දැකි පරිදි එසේ වෙනස් කොට සැලකීම එකී මනෝවිද්‍යාත්මක සාධක අනුව හේතු යුක්ති සහගත ද යන්න විමර්ශනය කිරීමත් මෙහි අරමුණ වේ.

ජීවවිද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක න්‍යාය සංකල්පයන්ට අනුව ස්ත්‍රිය හා පුරුෂයා සමාන හෝ විෂම වන්නේ ද යන්න විමර්ශනය කෙරෙන මෙම පර්යේෂණය පැතිකඩ කිහිපයකින් වැදගත් වේ. ඒ අනුව මූලික වශයෙන් ම මෙකී ගැටලුවට අදාළව ජීව විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක න්‍යාය සංකල්ප ආදී විවිධ පැතිකඩවලින් දත්ත රැස් කරමින් සිදු කරන ලද ගුණාත්මක පර්යේෂණ ඉතා දුලබ බැවින් එම ක්ෂේත්‍රවල ශාස්ත්‍රවන්තයන්ට, විද්වතුන්ට හා වෘත්තිකයන්ට මූලික ශාස්ත්‍රීය දැනුමක් ලබා දීමට මෙය වැදගත් වනු ඇත. එමෙන්ම එම දැනුම මනෝවිද්‍යාත්මක උපදේශනය, වෘත්තිය උපදේශනය ආදි වෘත්තිමය ක්ෂේත්‍රයන්හි නිරත වන්නන් හටත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ශිෂ්‍යයා සමග කටයුතු කරන පාසල් ප්‍රජාවටත් සමස්තයක් ලෙස සමාජයටත් ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම පිළිබඳ මිත්‍යා ආකල්ප නැවත විමසා බැලීමට සහ බැහැරලීමට මෙමගින් අවස්ථාවක් නිර්මාණය කෙරෙයි.

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ වෙනස් කොට සැලකීම සම්බන්ධ විවිධ විෂය ක්ෂේත්‍ර පවතින නමුත් මෙහිදී ජීව මනෝවිද්‍යාත්මක, සමාජ මනෝවිද්‍යාත්මක හා සාමාන්‍ය මනෝවිද්‍යාත්මක පැතිකඩ පමණක් අධ්‍යයනය කිරීමට සීමා කරන ලදී. මෙහි ජීවවිද්‍යාත්මක සාධකය යටතේ ස්ත්‍රී පුරුෂ ශරීරයන්හි වර්ණදේහ ව්‍යූහය, මධ්‍ය ස්නායු පද්ධතියේ ක්‍රියාකාරිත්වය සහ අන්තරාසර්ග පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විමර්ශනය කරන ලද අතර සාමාන්‍ය මනෝවිද්‍යාත්මක ලක්ෂණ වශයෙන් පුද්ගල පෞරුෂය, චින්තනය, තොරතුරු සකස්

කිරීම, ගැටලු විසඳීම සහ මතකය යන පැතිකඩ පිළිබඳව අධ්‍යයනයට සීමා කරන ලදී. එසේම නූතන සමාජ සංස්කෘතික සන්දර්භයන්හි ස්ත්‍රී පුරුෂ භූමිකාවන්හි ස්වභාවය ද මෙහි අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් වේ.

**සාහිත්‍ය විමර්ශනය**

ස්ත්‍රිය පුරුෂයාට වඩා පහත්ය යන ඒකාකෘතික ආකල්පය දුරාතීතයේ පටන් ආසියාතික මෙන්ම බටහිර බොහෝ සමාජ සංස්කෘතීන්හි මුල් බැස ගෙන තිබුණි. නිවසේ ගෘහ මූලිකයා පියා වූ අතර පියා නොමැති නම් වැඩිමහල් පුතෙකු පවුලේ වගකීම් දැරූ අතර ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේය (බෂාම්, 2012: 233). විශේෂයෙන්ම පුරුෂ මූලික සමාජයක් වූ බුද්ධ කාලීන භාරතය තුළ කාන්තාව විවිධ අයුරින් වෙනස් කොට සැලකීමට හා අඩු සැලකිල්ලට, පීඩනයට හා අසහනයට ලක් වූ බව බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් පෙන්වා දිය හැකි ය. ධනංජානි බ්‍රාහ්මණියාගෙන් පීඩාවට පත් එම බැමිණිය (සංයුක්තනිකාය 1, ධනංජානි සූත්‍රය: 286), තමාට දාව දියණියක ඉපදීම හේතුවෙන් කණස්සල්ලට පත් පසේනදී කොසොල් රජු (සංයුක්තනිකාය 1, ධීතු සූත්‍රය: 158) වැනි සිදුවීම් ඊට නිදසුන් සපයයි. එකල සමාජ සංස්කෘතික පරිසරය, නීතිය මගින් මෙන්ම ආගම තුළින් ද කාන්තාව පහත් කොට සැලකීමට පෙළඹවීය (බෂාම්, 2012: 233).

ඇතැම් විග්‍රහයන්ට අනුව වර්තමාන සමාජයේ ද බොහෝ ආසියාතික රටවල ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම දැකිය හැකි ය (Mehrotra, and Kapoor, 2009). නමුත් අතීතයේ සිට ශ්‍රී ලාංකේය සමාජය තුළ ස්ත්‍රිය වෙනස් කොට සැලකීමට වඩා පුරුෂයා හා සමාන අයිතීන් හිමි තත්ත්වයක ලා සලකන ලද බව සාහිත්‍යමය මූලාශ්‍රය අනුව පෙන්වා දිය හැකි ය. ඒ අනුව බෞද්ධ ආභාසය ලත් ශ්‍රී ලංකාව තුළ අතීතයේ සිට ම උගත්, බුද්ධිමත්, සිල්වත්, වංශවත් ස්ත්‍රිය සමාජයේ ගෞරවයට පාත්‍ර වූවා ය. අනුලා දේවී වැනි කාන්තාවන් අතීතයේ සිට ලක්දිව පාලන තන්ත්‍රය ද මෙහෙයවූ අතර (ලංකා ඉතිහාසය, 1972) නූතනය දක්වා එකී සම්භාවනීයත්වය ප්‍රකටව දැකිය හැක.

මෑත කාලීනව සිදු කරන ලද පර්යේෂණවලට අනුව ඇමෙරිකාව වැනි රටවලින් ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම්ව වෙනස් කොට සැලකීම පිළිබඳ තොරතුරු අනාවරණය වේ. Lois Margaret Nora සහ පිරිස (2002) විසින් වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම පිළිබඳ අද්දැකීම් හා ආකල්ප හඳුනාගැනීම සඳහා සිදු කරන ලද පර්යේෂණයකින් පෙන්වා දෙන්නේ උපාධි අපේක්ෂකයන් ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කණ්ඩායම් අතර එවැනි වෙනස් කොට සැලකීමේ නැඹුරුවක් පිළිබඳ අද්දැකීම් වාර්තා වන බවයි. එසේම ඇමෙරිකාව තුළ සිදු කරන ලද තවත් පර්යේෂණයකින් පෙන්වා දෙන්නේ විශේෂයෙන් කුලය හෝ ජාතිය හෝ ස්ත්‍රී පුරුෂ භාවය (LGBTQ) මත පදනම්ව සිදු වන වෙනස් කොට සැලකීම හා පීඩාවට පත් කිරීම පිළිබඳ අද්දැකීම් ජීවිතයේ විවිධ අවස්ථාවන්හිදී සිදු වූ බව කාන්තාවන් විසින් වාර්තා කරන බවයි (SteelFisher, et al., 2019).

නූතන සමාජ විද්‍යාත්මක, මානව වංශ විද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව ස්ත්‍රිය හා පුරුෂයා අතර ජීවවිද්‍යාත්මක හෝ භෞතික වෙනස්කම් ප්‍රමාණය ඉක්මවූ කිසිඳු වෙනසක් නොමැති බවට ඇතමෙක් තර්ක කරන අතර පරිණාමීය වශයෙන් උරුම වූ යම් යම් වෙනස්කම් රාශියක් සේම බොහෝ මනෝවිද්‍යාත්මක වෙනස්කම් ද මොවුන් දෙදෙනා අතර පවතින බව ඇතැම් පර්යේෂණවලින් පෙන්වා දේ. සමාජ විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කරන 'සමාජ නිර්මාණවාදී' න්‍යාය අනුව තර්ක කරන්නේ ජීවවිද්‍යාත්මක වශයෙන් ගැහැණු හා පිරිමි මොළය සමාන වන බවත් ස්ත්‍රී පුරුෂ භාවය සමාජානුයෝජනය සමඟ ඇති කරන සමාජ සංස්කෘතික නිර්මාණයක් වන බවත්ය. එසේම ඇමෙරිකානු මනෝවිද්‍යා සංගමය (2005) විශ්ලේෂණය කරන පරිදි ස්ත්‍රී පුරුෂයන් මූලික වශයෙන් පෞරුෂය, ප්‍රජානන හැකියාවන්, නායකත්වය වැනි මනෝවිද්‍යාත්මක පැතිකඩවලින් බෙහෙවින්ම සමාන වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයට අයත් ග්‍රන්ථ සන්ධාර අධ්‍යයන ක්‍රමවේදය අනුව සිදු කරන ලදී. පුස්තකාල

පරිහරණය මෙන්ම අන්තර්ජාලය පරිශීලනය මගින් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් ප්‍රස්තුතයට අදාළ දත්ත රැස් කර ගන්නා ලදී. රැස් කර ගන්නා ලද ගුණාත්මක දත්ත සන්ධාර විශ්ලේෂණය හා තේමා විශ්ලේෂණ ක්‍රමයන් අනුව විශ්ලේෂණය කොට නිගමනය ඉදිරිපත් කරන ලදී.

## දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව

පර්යේෂණ ගැටලුවට අදාළව ජීව විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්ෂේත්‍රයන්හි පවතින න්‍යායාත්මක දත්ත හා නූතන සමාජ සංස්කෘතික දෘෂ්ටීන්ට අදාළ දත්ත රැ ස් කරගන්නා ලද අතර එම දත්ත 'ජීව විද්‍යාත්මක ව්‍යූහය හා එහි ක්‍රියාකාරිත්වය, සාමාන්‍ය මනෝවිද්‍යාත්මක පැතිකඩ, ස්ත්‍රී පුරුෂ භාවය විෂයෙහි සමාජ බලපෑම, නූතන සමාජ නැඹුරුතා පිළිබඳ නිරීක්ෂණය' යන ප්‍රධාන තේමාවන් හතර සහ ඒවාට අයත් අනු තේමාවන් යටතේ විශ්ලේෂණය කරන ලදී.

## ජීවවිද්‍යාත්මක ව්‍යූහය හා එහි ක්‍රියාකාරිත්වය

ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර කායික වශයෙන් පවතින විෂමතාව, එනම්, ලිංගිකත්වය, ශරීර ස්වරූපය වැනි පොදුවේ දැකිය හැකි ජීව විද්‍යාත්මක ව්‍යූහයෙහි වෙනස්කම් පිළිබඳව විවාදයක් නොමැති අතර ඒවා ස්ත්‍රී පුරුෂයන් වෙන් කොට හඳුනාගැනීමෙහිලා පවතින මූලික සාධක වේ. පරිණාමීය මනෝවිද්‍යාඥයන් යෝජනා කරන පරිදි ස්ත්‍රී පුරුෂයන් අතර පවතින බොහෝ දේහවිද්‍යාත්මක සම විසමතාවන් පරිණාමීය වශයෙන් වැදගත් වන හා වර්ගයාගේ පැවැත්ම සඳහා අතිශයින් ඉවහල් වන සාධකයන් වේ (Conner, 2000)' නිදසුනක් ලෙස පෙකණිය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම උපතින් උරුම වන දෛහික ලක්ෂණයක් වන නමුත් පෙකණිවැල ස්ත්‍රියට පමණක් උරුම වන්නක් වන අතර එය වර්ගයාගේ අඛණ්ඩතාව සඳහා අතිශයින් වැදගත් වන අංගයකි. මේ අනුව පරිණාමීය මනෝවිද්‍යාඥයන් තර්ක කරන්නේ මානව වංශිකයන්ට ඔවුන්ගේ පැවැත්ම සහ ප්‍රජනන සාර්ථකත්වය සඳහා ස්ත්‍රී පුරුෂයන්ට එකිනෙකට වෙනස් වූ භෞතික අංග ජීව විද්‍යාත්මකව උරුමව ඇති බවයි (McLeod, 2014). ඒ අනුව ඊට යෝග්‍ය පරිදි සකස්ව පවතින වර්ණදේහ ව්‍යූහය, මොළයේ හා

හෝර්මෝනමය ක්‍රියාකාරීත්වය විශේෂයෙන් සැලකිල්ට භාජනය කළ යුතු කරුණු වේ.

**වර්ණදේහ**

පුද්ගලයකුගේ ලිංගිකත්වය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකය වන්නේ ජානමය සාධකයයි. මිනිස් සෛලයක් තුළ වර්ණදේහ (ක්‍රෝමසෝම) හතලිස් හයක් (46) අන්තර්ගත වේ. එම හතලිස් හයෙන් හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන වර්ණදේහ දෙකක් බැගින් එක්වී යුගල විසි දෙකක් (22) සකස් වෙයි. විසි තුන්වැනි (23) වර්ණදේහ යුගලය ලිංගික වර්ණදේහ ලෙස හැඳින්වෙන අතර එම යුගලය ස්ත්‍රී පුරුෂ භාවය තීරණය කිරීමේ ප්‍රධාන සාධකයයි (අබේපාල, 2015: 75). විද්‍යාත්මක ඉදිරිපත් කිරීම්වලදී මෙම වර්ණදේහ යුගලය X සහ Y ලෙස හඳුන්වයි (McLeod, 2014). ස්ත්‍රියකගේ සෛලයක සාමාන්‍ය වර්ණදේහ යුගල විසි දෙකක්ද XX වර්ණදේහ යුගලයක්ද පවතියි. පුරුෂ සෛලයක සාමාන්‍ය වර්ණදේහ විසි දෙකක් හා XY වර්ණදේහ දෙකක එකතුවක් අන්තර්ගත වෙයි.

පුරුෂ (Males) = XY

ස්ත්‍රී (Females) = XX

එමෙන්ම මෙම ක්‍රෝමසෝම් වෙනස ලිංගික වෙනසට සමගාමීව ඒ ඒ ශරීරය තුළ පුද්ගලයාට අදාළ අනෙකුත් කායික ලක්ෂණයන්ද සකස් කර දීමට ජානමය පදනමක් සපයයි (Kowalczyk, 2003). තවද, මිනිස් මොළයේ ලිංගික වෙනස්කම්ද මෙම ක්‍රෝමසෝම් යුගලය මගින් තීරණය කරන බව ඇතැම් පර්යේෂණකයෝ නිගමනය කරති.

**මොළය**

ස්ත්‍රී පුරුෂ මොළයන්හි සමානතා සේම විෂමතාද බොහෝ පර්යේෂණ මගින් පෙන්වා දී තිබේ. නිදසුනක් ලෙස වම් සහ දකුණු මොළය සම්බන්ධ කරන ඇතැම් මස්තිෂ්ක සෛල පුරුෂයන්ට වඩා සිව් ගුණයක් පමණ ස්ත්‍රීන්ගේ වැඩි බවත් එය ගැටලු විසඳීමේදී ස්ත්‍රියට වඩාත් උදව් වන බවත් ඇතැම් පර්යේෂණ මගින් යෝජනා කරයි. එනිසාම යම් ගැටලුවක් දෙස බැලීමට පිරිමියෙකු වරකට එක්

එළඹුමක් භාවිත කරද්දී ස්ත්‍රියට එම ගැටලුව දෙස විවිධ පැතිකඩවලින් බලා විවිධ විසඳීමේ එළඹුම් භාවිත කළ හැකිය. එසේම ඇයට වරකට එක් ප්‍රශ්නයකට වඩා අවධානය යොමු කළ හැකි අතර භව්‍ය විසඳුම් ලෙස බහුවිධ ක්‍රියාකාරකම් උපයුක්ත කර ගැනීමේ හැකියාව පවතින බව පෙන්වා දේ (Conner, 2000).

ඇතැම් පර්යේෂණයන්ට අනුව පුරුෂයින්ගේ මොළයේ විශාලත්වය ස්ත්‍රී මොළයට වඩා වැඩි වන අතර එහි සාමාන්‍යය සියයට එකොළහ-දොළහ (heavier an average of 11-12%) පමණ වෙයි (Jodi, 2009). නමුත් පිරිමි පුද්ගලයා ස්ත්‍රියට වඩා බුද්ධිමත් හෝ වඩා හොඳ බව ඉන් අදහස් නොකරන අතර අදාළ මොළයේ ප්‍රමාණාත්මක වෙනස බෙහෙවින්ම පුද්ගලයාගේ ශරීර ස්බන්ධය හා සම්බන්ධ බව පැවසෙයි. කෙසේ නමුත් ශරීර විශාලත්වයට සාපේක්ෂව මොළය අනුපාතයක් ලෙස ස්ත්‍රී පුරුෂ දෙපිරිසගේම වෙනස් නොවන බවද ඇතැම් පර්යේෂකයන් පෙන්වා දේ (Kowalczyk, 2003).

### අන්තරාසර්ග පද්ධතිය

හෝමෝන ක්‍රියාකාරීත්වය පිළිබඳ පර්යේෂණයන්ට අනුව ස්ත්‍රී පුරුෂයන් ලිංගිකත්වය මත විශාල වෙනසක් සිදු නොවන බව ප්‍රකට වෙයි. නිදසුනක් ලෙස මෙම දෙපිරිසගේම ලිංගික උත්තේජනය සඳහා ටෙස්ටෙස්ටරොන් නැමැති ලිංගික හෝමෝනය ක්‍රියාකාරී වන බව පෙන්වා දෙයි. නමුත් එකී හෝමෝන නිකුත් කරන ප්‍රමාණය සහ එක් එක් ශරීර අංගයන්හි ක්‍රියාකාරීත්වය සඳහා බලපාන ආකාරය දෙපිරිසෙහි වෙනස් වෙයි (McLeod, 2014; Jantz, 2014). නිදසුනක් ලෙස පිරිමින්ගේ ටෙස්ටෙස්ටරොන් හෝමෝනය අධිකව ශ්‍රාවය වීම නිසා ස්ත්‍රියට වඩා ආක්‍රමණශීලී වීම, අධික ලිංගික ආශාවන් ඇති වීම සහ තරගකාරීත්වය වැනි ලක්ෂණ පෙන්නුම් කරයි. එසේම මෙම හෝමෝනය ස්ත්‍රී පුරුෂ දෙපිරිසගේම ශරීර වර්ධනය සඳහාද බලපානු ලබයි (McLeod, 2014).

### සාමාන්‍ය මනෝවිද්‍යාත්මක පැතිකඩ

ස්ත්‍රිය සහ පුරුෂයා මනෝවිද්‍යාත්මකව සමාන වන්නේද, අසමාන වන්නේද යන්න පිළිබඳ අදහස් හා පර්යේෂණාත්මක සොයා

ගැනීම් එකිනෙකට වෙනස් වන නමුත් සැලකිය යුතු තරම් විශාල වෙනසක් නොමැති බව බොහෝ විද්වතුන්ගේ පිළිගැනීමයි. මේ පිළිබඳ පර්යේෂණ කළ ඇතැම් මනෝවිද්‍යාඥයන් ස්ත්‍රීපුරුෂභාවය තුළ කිසිඳු මනෝවිද්‍යාත්මක වෙනසක් නොමැති බව තර්ක කරන අතර ඇතැම්හු බොහෝ වෙනස්කම් පවතින බව පෙන්වා දෙති.

විවිධ පර්යේෂකයන් විසින් සිදු කරන ලද පර්යේෂණ හතලිස් හයක් (46) පමණ විශ්ලේෂණය කරමින් ඇමෙරිකන් මනෝවිද්‍යා සංගමය (2005) පෙන්වා දෙන්නේ පෞරුෂය, ප්‍රජානන හැකියාවන් සහ නායකත්වය වැනි මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් ස්ත්‍රිය සහ පුරුෂයා අතර අල්ප හෝ සැලකිය හැකි තරම් වෙනසක් නොමැති බවයි. එසේම මනෝවිද්‍යාඥයෙකු වන Janet Shibley Hyde අනාවරණය කරන පරිදි බොහෝ මනෝවිද්‍යාත්මක විචල්‍යයන්ගෙන් ස්ත්‍රිය හා පුරුෂයා ළමා වියේ සිට වැඩිහිටි විය දක්වාම වෙනස්කම්වලට වඩා සමානතා පෙන්වන බවයි (APA, 2005).

ස්ත්‍රිය හා පුරුෂයා සමාන නමුත් වෙනස් බව පවසන මිචෙල් ජී. කෝනර් (Michael G. Conner) ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ අරමුණ නිසා දෙපිරිස අතර පවතින වැදගත් වෙනස්කම් අපගේ අවබෝධයෙන් සහ අවධානයෙන් ගිලිහී යන බව පෙන්වා දේ. මිචෙල් එවැනි ජීවවිද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක වෙනස්කම් රාශියක්ද ඉස්මතු කොට පෙන්වා දෙන අතර එකී වෙනස්කම් ස්ථාවර හෝ නියතියක් නොවන බවත් එය ස්ත්‍රිය හා පුරුෂයා එක් එක් අවස්ථාවන් අනුව එක් එක් වෙලාවේදී ක්‍රියා කරන ආකාරයෙහි වෙනසක් පමණක් බවත් පවසයි (Conner, 2000).

**චින්තනය, තොරතුරු සකස් කිරීම සහ ගැටලු විසඳීම**

චින්තනයේ දී, ගැටලු විසඳීමේ දී හා තොරතුරු සකස් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ දෙපිරිසම සමාන චින්තන හැකියාවකින් යුක්ත වේ. නමුත් එක් එක් කාර්යය කෙරෙහි ස්ත්‍රී පුරුෂයන් ක්‍රියාත්මක වන ආකාරය හා චින්තනය මෙහෙයවන එළඹුම් එකිනෙකාට වෙනස් වේ. සාමාන්‍යයෙන් ස්ත්‍රියට සහජයෙන් උරුමව ඇති පැතිරුණු විශ්වීය චින්තනයකින් හෙබි නැඹුරුවක් පවතී. ඇයට ගැටලුවක් දෙස විවිධ තොරතුරු මූලාශ්‍රය සලකමින් එක් එක් තොරතුරු එකට සම්බන්ධ

කරමින් දැකීමේ හැකියාවක් පවතී. එසේම ස්ත්‍රිය එක් චින්තනයකින් තවත් චින්තන කාර්යයක් කෙරෙහි ඉක්මනින් මාරු වීමේ හැකියාවක් ද වේ. පුරුෂයන් බොහෝ විට එක් අවස්ථාවකදී එක් චින්තන කාර්යයක් කෙරෙහි සම්පූර්ණ අවධානය දැක්වීමේ නැඹුරුවක් පවතින අතර එක් අවස්ථාවකදී එක් ගැටලුවක් කෙරෙහි හෝ සීමිත කාර්යයන් ප්‍රමාණයක් කෙරෙහි අවධානය යොමු කිරීමට කැමති වේ (Conner, 2000; Jantz, 2014). එසේ නමුත් එක් පාර්ශ්වයකගේ චින්තනය වඩා උසස්, ශ්‍රේෂ්ඨ ලෙස දැක්වීමට නොහැකි තරම් සම චින්තන හැකියාවක් දැකිය හැකිය.

තොරතුරු සකස් කිරීමේ ක්‍රියාවලියේ දී පිරිමි පුද්ගලයන් බෙහෙවින්ම වම් මොළය ප්‍රමුඛ කොට ක්‍රියා කරන අතර වම් සහ දකුණු මොළය සම්බන්ධ කරන පටක ස්ත්‍රීන්ට වඩා පුරුෂයන්ගේ අඩුය. ස්ත්‍රිය බෙහෙවින්ම දකුණු මොළය භාවිත කිරීමේ නැඹුරුවක් පවතින අතර මුහුණු ප්‍රකාශන, ඉඟි සහ ශරීර භාෂාවන් තේරුම් ගැනීමේ සහජ දක්ෂතාවකින් යුක්ත වෙයි. එනිසාම පියාට වඩා මවට කුඩා දරුවන්ගේ හැඟීම්, දැනීම් තේරුම් ගැනීමේ හැකියාවක් පවතින බව කෝනර් පවසයි (Conner, 2000). එසේම ඉහත දැක්වූ පරිදි ගැටලු විසඳීමේදීද ස්ත්‍රිය සහ පුරුෂයා සමාන හැකියාවන්ගෙන් යුක්ත වන නමුත් ගැටලුව සහ එහි විසඳුම වෙත අවතීර්ණ වීමේ එළඹුම හෙවත් ආකාරය වෙනස් වේ.

**පෞරුෂය**

ස්ත්‍රී පුරුෂ භාවය මත පුද්ගල පෞරුෂයෙහි සුවිශේෂ වෙනස්කම් නොමැති වුවත් ඇතැම් පෞරුෂ ලක්ෂණවලින් එකිනෙකා වෙනස් වන බව ඒ පිළිබඳ පර්යේෂණ කළ මනෝවිද්‍යාඥයන්ගේ සොයා ගැනීමයි. ජීවවිද්‍යාත්මක සාධක අනුව වෙනස් වන ස්ත්‍රී පුරුෂයන්ගේ පෞරුෂයෙහි ඇතැම් ලක්ෂණවල අඩුවැඩිතාවන් මිස පෞරුෂයෙහි උස් පහත් බවක් ඒ මත පදනම්ව තීරණය නොවන බව වැඩිදුරටත් අවධාරණය කෙරෙයි. ඇලන් ෆෙයින්ගෝල්ඩ් (1994) විසින් පෞරුෂයෙහි ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සිදු කළ පර්යේෂණයකට (Gender differences in personality: A meta-analysis) අනුව ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයා වඩා ගර්විත ලක්ෂණ පෙන්වන

අතර වැඩි ආත්ම සම්මානනයකින් යුක්ත වේ. එසේම බහිර්වර්තී පෞරුෂ ලක්ෂණ (උදාඃ සමාජශීලී බව), කාංසාව, විශ්වාස කිරීම සහ විශේෂයෙන්ම මෘදු සියුමැලි හදවතක් සහිත බව යන ලක්ෂණවලින් පුරුෂයින්ට වඩා ස්ත්‍රීන් වැඩි බව සොයා ගන්නා ලදී. නමුත් සමාජ කාංසාව, ආවේගශීලීබව, ක්‍රියාශීලීබව හා අදහස් ප්‍රකාශ කිරීම ආදී පෞරුෂ ලක්ෂණවල ස්ත්‍රී පුරුෂ භාවයෙහි වෙනසක් නොමැති බවද පෙන්වා දෙයි (Alan, 1994).

විවිධ සංස්කෘතීන් විසිහයක (26) පමණ පුද්ගලයන් සහභාගි කර ගනිමින් සිදු කරන ලද සංස්කෘතික හරස්කඩ පෞරුෂ ලක්ෂණ විශ්ලේෂණයකට අනුව ස්ත්‍රීන් නියුරෝෂීය ලක්ෂණ, එකඟවන සුලුබව, උණුසුම් බව සහ හැඟීම්වලට විවෘත බව ආදි පෞරුෂ ලක්ෂණවලින් පුරුෂයන්ට වඩා වැඩි අතර පුරුෂයන් ගර්විත බව, අදහස් ප්‍රකාශ කිරීමේ විවෘත බව ආදි ලක්ෂණවලින් වැඩි බව පෙන්වා දෙන ලදී. එසේම ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ පෞරුෂ ලක්ෂණද සංස්කෘතික වශයෙන් වෙනස් වන බව මෙම පර්යේෂණය මගින් සොයා ගන්නා ලදී (Costa et al., 2001). මෙහිදී විවිධ සංස්කෘතීන්හි තරුණ, වැඩිහිටි වයස්වලට අයත් වන පුද්ගලයන් තිස් දහසකට අධික ප්‍රමාණයක් යොදාගනිමින් පෞරුෂ විශ්ලේෂණය සිදු කොට ඇත.

මෙබඳු පර්යේෂණ මගින් පැහැදිලි වන පරිදි පුද්ගල පෞරුෂයේදී ස්ත්‍රිය හා පුරුෂයා යම් යම් පෞරුෂ ලක්ෂණවලින් අඩුවැඩිතාවන් පෙන්නුම් කරයි. එසේම ඇතැම් විට එවැනි උස්පහත්කම් සමාන ලිංගිකයන් අතරද විය හැකිය. කෙසේ නමුත් එම අසමානතා සලකා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පෞරුෂය උසස් හෝ පහත් ලෙස සැලකීම අනුචිත වේ.

**මතකය**

මතකය පිළිබඳ ස්ත්‍රී පුරුෂ වෙනසක් තිබේද යන්න පිළිබඳ මතවාදයන්ද එකිනෙකට වෙනස්, ස්ථාවර නොවන සහ මිශ්‍ර අදහස් සහිත වූයේ වෙයි. බොහෝ පර්යේෂණයන් පෙන්වා දෙන පරිදි දෙපිරිසගේම කෙටි කාලීන මතකයෙහි සැලකිය යුතු වෙනසක් නොමැති අතර එක් පිරිසකගේ මතකය ඉතා උසස් බවක් ප්‍රකාශ කිරීමට තරම් සාධක ද නොමැතිය. නමුත් ස්ත්‍රියගේ සහ පුරුෂයාගේ

මතකය ක්‍රියා කරන ආකාරයෙහි යම් යම් වෙනස්කම් ඇතැම් පර්යේෂණ මගින් පෙන්වා දී තිබේ. නිදසුනක් ලෙස මොළයේ හිපොකැම්පස් ප්‍රදේශය පුද්ගලයෙකුගේ මතකය හා සම්බන්ධව ක්‍රියා කරන ප්‍රධාන ස්ථානය වන අතර එය ස්ත්‍රියගේ සහ පුරුෂයාගේ ටෙස්ටෙස්ටරොන් හෝමෝනය විෂයෙහි දෙයාකාරයකින් ප්‍රතික්‍රියා කරයි. එනම්, එය ස්ත්‍රීන්ගේ ඊස්ට්‍රජන් සහ ප්‍රොජෙස්ටෙරොන් හෝමෝන මට්ටම වෙනස් කිරීමට ප්‍රතික්‍රියා කරන අතර මේ හේතුවෙන් කාන්තාවන්ට බොහෝ විට චිත්තවේගීමය අද්දැකීම් සහිත මතකයන් සිහිපත් කිරීමේ වැඩි හැකියාවක් පවතියි (Conner, 2000).

මනෝවිද්‍යාත්මක පර්යේෂණයන්ට අනුව දැඩි හෝ පොදුවේ චිත්තවේගික සිදුවීම් සම්බන්ධ දෑ මතකයේ තබා ගැනීමට සහ පහසුවෙන් මතකයට නඟා ගැනීමට කාන්තාව පුරුෂයාට වඩා වැඩි නැඹුරුවක් බවතින බව සොයාගෙන තිබේ (Canli, Desmond, Zhao ) Gabrieli, 2001). එම අදහසට ප්‍රතිපක්ෂව පුරුෂයන්ට වඩාත් පහසුවෙන් මතකයට නඟාගත හැක්කේ කාර්යයන්, ක්‍රියාකාරකම්, සිදුවීම්, කායික ක්‍රියාකාරකම්, තරගකාරී අද්දැකීම් වැනි අද්දැකීම් බව පර්යේෂණය මගින් පෙන්වා දෙයි (Conner, 2000). ඒ හැර ස්ත්‍රී පුරුෂ භාවය මත මතක ශක්තියෙහි උස් පහත් බවක් ඇතැයි සනාථ කිරීමට තරම් පර්යේෂණාත්මක කරුණු සොයා ගැනීම උභගට වෙයි.

**ස්ත්‍රී පුරුෂ භාවය විෂයෙහි සමාජ බලපෑම**

සමාජ විද්‍යාඥයන් හා සමාජ මනෝවිද්‍යාඥයන් බහුතරයක් එකඟ වන පරිදි ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම සමාජ සංස්කෘතික නිර්මාණයකි. ලිංගිකත්වය මත ඇති භෞතික වෙනස්කම් පදනම් කර ගනිමින් සමාජය පුද්ගලයන් වර්ගීකරණය කිරීමට උත්සාහ කරන අතර (Zevallos, 2014) ඒ නිසාම ස්ත්‍රී පුරුෂ භාවය නැමැති වෙනස් කොට සැලකීමේ නැඹුරුව නිර්මාණය වී ඇත. ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සමාජ නිර්මාණවාදී න්‍යායට අනුව දරුවෙකුගේ උපතේදී භෞතිකව පෙනෙන ලිංගික අවයවය මත පදනම්ව ස්ත්‍රී හෝ පුරුෂ ලෙස වර්ගීකරණය කරනු ලබයි. එහිදී පෙනෙන ලක්ෂණය අනුව ළදරුවාට ඇඳුම් ඇන්දවීම, පැළඳවීම හා වර්ණ තේරීම ආදිය

සිදු කරනු ලබන අතර එය අන්‍යයන්ට තම දරුවා ගැහැණුද පිරිමිද යන්න සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් ලෙසද භාවිත කෙරේ.

අධ්‍යාපනය, රැකියාව, දේශපාලනය, ක්‍රීඩාව, ඇඳුම්, පැළඳුම්, භූමිකා ආදියෙන් ස්ත්‍රී පුරුෂ වෙනසක් නොවන කල උපතේදී ඇති දෛහික ලක්ෂණ මහත් සේ වැදගත්කොට සලකා ස්ත්‍රී පුරුෂ සමාජභාවයක් නිර්මාණය කරන්නේ කුමක් සඳහාදැයි ඇතැම් සමාජ විද්‍යාඥයෝ විමසති (Lorber, 1994). හුදෙක්ම ජනනේන්ද්‍රිය බලා සිදු කරන මෙම වර්ගීකරණය නිසා ස්ත්‍රී පුරුෂ භාවය නම් සමාජභාවය නිර්මාණය වේ. එතැන් සිට ඇඳුම, පැළඳුම, නම් තැබීම ආදියද ඊට අනුකූලව සිදු කෙරෙයි. ක්‍රමයෙන් එම දරුවන්ද එකී වෙනස් කොට සැලකීමට අනුගත වන අතර දෙමාපියන්, මිතුරු කණ්ඩායම් හා ජනමාධ්‍ය, සමාජ මාධ්‍යය ආදි බලපෑම මත හා අනුකරණයෙන් උගත් වාග් විලාසය, හැසිරීම ආදිය මගින් තම අන්‍යතාව ප්‍රකට කිරීමට පුහුණු වේ. ඒ හැර මල්වර වීමේ වයස පමණ දක්වා එම වෙනස් කොට සැලකීමේ අර්ථය පිළිබඳ අවධානයක් හා අවබෝධයක් එම ළමයින් හටද නොමැති තරම් ය. ඒ වන විටත් ඊට අනුකූල සමාජ ආකල්ප හා ස්ත්‍රී පුරුෂ සමාජ ඇගයීම් මගින් ළමයා හැඩගස්වා නිමවී ඇත (Lorber, 1994). ඒ අනුව ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීමේ නැඹුරුවට නොදැනුවත්වම, නිරායාසයෙන්ම එම දරුවා පාත්‍ර වන අතර එය පවත්වාගෙන යාමට ද ඔහු/ඇය කටයුතු කරයි.

### නූතන සමාජ නැඹුරුතා පිළිබඳ නිරීක්ෂණය

අදාළ ප්‍රස්තුතය සම්බන්ධයෙන් නූතන සමාජ සංස්කෘතික නැඹුරුතාවන් විමසා බැලීම අත්‍යවශ්‍ය පැතිකඩකි. ඒ අනුව වර්තමාන සමාජයේ බොහෝ සංස්කෘතීන්හි ස්ත්‍රී පුරුෂ භූමිකා වෙනස් වෙමින් පවතින බව නිරීක්ෂණය කළ හැකි ය. පියා තම භූමිකාව වෙනස් කරමින් දරුවන් රැකබලා ගැනීමත් දරුවන් සුරතල් කිරීම, පාසලට රැගෙන යාම හා පාසලෙන් ගැනීම, නැවීම, කැවීම ආදී කුදුමහත් කටයුතු සිදු කිරීමත් ඒ අතර දැකිය හැකි ය. ස්ත්‍රිය නිවසට වී දරුවන් රැකබලා ගනිමින් ඉවුම් පිහුම් කිරීම වෙනුවට පුරුෂයා හා සමානව රැකියාවන්හි නිරත වීම වර්තමානයේ සුලභ කරුණකි. සමාජ ආර්ථික තත්ත්වයන් මත ස්ත්‍රී පුරුෂ දෙදෙනාම රැකියාවන්හි නිරත වන අතර

එහි අසමානතාවක් දැකිය නොහැකිය. ස්ත්‍රී පුරුෂ දෙදෙනාම සමාන අධ්‍යාපන අවස්ථා හිමි කර ගන්නා අතර පුද්ගලයාට ආවේණික බුද්ධිමය වෙනස්කම් අනුව සාපේක්ෂ දක්ෂතා පෙන්නුම් කරයි. ඇඳුම් පැළඳුම් විෂයෙහිද ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම පොදු ඇඳුම් පැළඳුම් පරිහරණය කරනු දක්නට ලැබේ. මිතුරු කණ්ඩායම් තෝරාගැනීමේදී සමාන ලිංගික මිතුරු කණ්ඩායම් ඇසුරු කළ යුතුය යන සාම්ප්‍රදායික දෘෂ්ටිකෝණයෙන් වෙන්ව මිතුරන් තෝරාගනු දක්නට ලැබේ.

එසේ නමුත් ඇතැම් සංස්කෘතීන්හි ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට සැලකීම මුල්බැසගත් ආකෘතීන් ලෙස තවමත් පවතින බව ද දැකිය හැකි ය. දැඩි ආගමික බලපෑමක් සහිත ඇතැම් සමාජ සංස්කෘතීන්හි මෙම තත්ත්වය වඩාත් උග්‍ර වෙයි. ඒ තුළ අධ්‍යාපනයට හෝ රැකියාවට හෝ දේශපාලනයට හෝ සමාජ භූමිකාවට හෝ හැසිරීමට හෝ පමණක් නොව ඇඳුම් පැළඳුම්වලට පවා එකී ආකල්පයන් දැඩිව බලපා ඇති අතර එම ඒකාකෘතීන් තුළ ස්ත්‍රිය හා පුරුෂයා සිරකර තැබීමට යත්න දරන බවක් පෙනෙයි. එමෙන්ම බොහෝ ප්‍රගතිශීලී සමාජ සංස්කෘතීන්හි පවා දේශපාලනය වැනි ක්ෂේත්‍රවල පුරුෂාධිපත්‍යය පැතිරුණු ස්වභාවයක්ද දැකිය හැකි ය. ඒ හේතුවෙන්ම දේශපාලනය තුළ ස්ත්‍රී නියෝජනය වැඩි කිරීමේ අරමුණින් නව නීති සම්පාදනයන්ද යෝජනා වේ.

ස්ත්‍රියට සමාන වූ සමාජ අවස්ථාවන් හිමි කර දෙන අතරම ඇයගේ සාම්ප්‍රදායික භූමිකාවන්ද ඒ අයුරින්ම පවත්වාගෙන යාමට පොළඹවන බවක්ද දැකිය හැකි ය. නිදසුනක් ලෙස ගුරුවරියක හෝ කථිකාචාර්යවරියක ලෙස හෝ වෙනත් වෘත්තියක නිරත වන උගත් ස්ත්‍රිය වුවද එම භූමිකාවට අමතරව නිවසේදී සාම්ප්‍රදායික භූමිකාවටද වගකීම් සහගත විය යුතු බව බොහෝ පුරුෂයෝ උපකල්පනය කරති. ඒ අනුව හැකියාව හා අවස්ථාව පැවතියේ නමුත් ඇතැම් පුරුෂයෝ ආහාර පිසීම, රෙදි සේදීම, පිරිසිදු කිරීම ආදි ගෘහස්ථ කාර්යයන් ස්ත්‍රියටම පවරා නිදහස් වීමට උත්සාහ දරති. තවද සමිති සමාගම් අවස්ථාවන්හි සභාපති ධූරය සඳහා පුරුෂයාත් ලේකම් ධූරය සඳහා ස්ත්‍රියත් සුදුසු යැයි නිගමනය කරන්නේද මෙබඳුම ආකල්ප තුළ සිරවී සිටින්නෝ ය.

## නිගමනය

ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් වීම ජීවවිද්‍යාත්මක වෙනස්කමක් මිස එය සමාජ විද්‍යාත්මක හෝ මනෝවිද්‍යාත්මක සාධකයක් ලෙස දැක්වීමට ප්‍රමාණවත් සාක්ෂ්‍ය නොවන බව උක්ත කරුණු අනුව පෙන්වා දිය හැකි ය. හුදෙක්ම එය ජනනේන්ද්‍රියේ ස්වභාවය මත පමණක් වන අතර ජීවවිද්‍යාත්මකව අනෙකුත් ඉන්ද්‍රිය පද්ධතීන්ගේ හෝ මොළයේ කැපී පෙනෙන වෙනස්කමක් දැකිය නොහැකිය. එමෙන්ම මනෝවිද්‍යාත්මක පැතිකඩ ලෙස පෞරුෂය, බුද්ධිය, මතකය, චින්තනය, ගැටලු විසඳීම ආදි ප්‍රජානන හැකියාවන්ගේ සාපේක්ෂ වෙනස්කම් මිස ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැති බව මනෝවිද්‍යාත්මක පර්යේෂණවලින් තහවුරු වේ. මිනිස් චර්යාව හුදෙක්ම සමාජ අනුකරණයෙන් ඉගෙන ගන්නක් බැවින් ස්ත්‍රී පුරුෂ චර්යාත්මක වෙනස්කම් වේ නම් ඒවා සමාජ සංස්කෘතික පරිසරයෙහි බලපෑම මත සිදු වන්නක් ලෙස සැලකිය හැකිය. ඒ අනුව උපතේදී හිමි වන ඉන්ද්‍රිය ලක්ෂණයක් හේතුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස් කොට සැලකීමෙහි කිසිඳු මනෝවිද්‍යාත්මක පදනමක් නොමැති බව පැහැදිලි වේ. තවද ස්ත්‍රීභාවය හෝ පුරුෂභාවය එකිනෙකට සමාන හෝ අසමාන ලෙස නොසැලකිය හැකි අතර අන්‍යෝන්‍ය පුද්ගල සාපේක්ෂතාව පමණක් සැලකිය හැකි බවද නිගමනය කළ හැකිය.

කෙසේ නමුත් නූතන ලෝකයේ දේශපාලන, මානව හිමිකම් හා අයිතිවාසිකම් ආදි ක්ෂේත්‍රයන්හිදී කාන්තාවන්ට විශේෂ වරප්‍රසාද ලබා දීමටද කටයුතු කෙරෙයි. ඇතැම් අවස්ථාවන්හිදී කාන්තාවන්ට ප්‍රමුඛත්වය දිය යුතු බවද අවධාරණය කෙරෙයි. එය ස්ත්‍රීත්වය හේතුවෙන් සිදු කරන විශේෂතාවක් නමුත් වෙනස් කොට සැලකීමක් ලෙස සැලකිය නොහැකිය. ස්ත්‍රී පුරුෂ භාවය සැලකීමෙන් තොරව වෘද්ධ පුද්ගලයන් හා ළමුන්ට එම ප්‍රමුඛතාව හිමිවිය යුතු යැයි පැවසීමෙහි විවාදයක් නොමැත. නමුත් ස්ත්‍රීත්වය මත අතිවිශේෂත්වයක් ආරෝපණය කළ යුතු නැතැයිද දැක්විය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අබේපාල, රෝලන්ඩ්. (2015). **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**. කොට්ටාව: සාර ප්‍රකාශන.

බෂාම්, ඒ එල්, (2012), **අසිරිමත් ඉන්දියාව** (4 මුද්‍රණය), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**ලංකා ඉතිහාසය,** (1972), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය.

**සංයුක්තනිකාය** 1, ධනංජානි සූත්‍රය, (2006), බු. ජ. ත්‍රි. ග්‍රංනැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**සංයුක්තනිකාය** 1, ධීතු සූත්‍රයඃ, (2006), බු. ජ. ත්‍රි. ග්‍රඃ නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Alan, F. (1994). Gender differences in personality: A meta-analysis. Retrieved from http://psycnet.apa.org/buy/1995-09434-001.

APA. (2005). Men and Women: No Big Difference. Retrieved from http://www.apa.org/research/action/ difference.aspx.

Canli, T., Desmond, J. E., Zhao, Z. & Gabrieli, G. D. E. (2001). Sex differences in the neural basis of emotional memories. Retrieved from http://www.pnas.org/content/99/16/10789.full.

Conner, M. G. (2000). Understanding The Difference Between Men And Women. Retrieved from http://www.oregoncounseling.org/ArticlesPapers/Documents/DifferencesMenWomen.htm.

Costa J.R. & others. (2001). Gender differences in personality traits across cultures: Robust and surprising findings. Journal of Personality and Social Psychology. Vol 81(2). Aug 2001. 322-331, Retrieved from http://psycnet.apa.org/buy/2001-01642-012.

Jantz, G. L. (2014). Brain Differences Between Genders. Retrieved from https://www.psychologytoday.com/blog/hope-relationships/201402/brain-differences-between-genders.

Jodi, O.B. (2009). Encyclopedia of Gender and Society. Los Angeles: SAGE.

Kowalczyk, D. (2003-2018). Biological Differences Between the Sexes: Overview. Retrieved from https://study.com/academy/lesson/biological-differences-between-the-sexes-lesson-quiz.html.

Lorber, J. (1994). Night to His Day: The Social Construction of Gender. Retrieved from http://armine.pbworks.com/f/reading+9.pdf.

McLeod, S. A. (2014). Biological theories of gender. Retrieved from www.simplypsychology.org/gender-biology.html.

Mehrotra, S. and Kapoor, S. (2009) 'Gender Discrimination in Asia', Global Social Policy, 9(1_suppl), pp. 197–205. doi:10.1177/1468018109106891.

Nora, L.M. et al. (2002) ‘Gender Discrimination and Sexual Harassment in Medical Education: Perspectives Gained by a 14-school Study’, Academic Medicine, 77(12 Part 1), pp. 1226–1234.

SteelFisher, G.K. et al. (2019) ‘Gender discrimination in the United States: Experiences of women’, Health Services Research, 54 Suppl 2, pp. 1442–1453. doi:10.1111/1475-6773.13217.

Zevallos, Z. (2014). Sociology of Gender. The Other Sociologist. 28 November. Retrieved from https://othersociologist.com/sociology-of-gender/.